කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී පළමුවන වසර පරීක්ෂණය

පළමු සෙමෙස්තරය - 2022/2023

**FND 1104 - කලාව හා සංස්කෘතිය පිළිබඳ ගැටලු**

පැ දෙකයි

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න**

---

01. "කලාවට ලෝකය වෙනස් කළ නොහැකි ය. එහෙත් මිනිසුන් වෙනස් කළ හැකි ය. වෙනස් වූ මිනිස්සු ලෝකය වෙනස් කරති" මේ ප්‍රකාශය ඔබ කැමති කලා නිර්මාණ ඇසුරින් විමර්ශනයට ලක් කරන්න.

02. "නූතන විභාග කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්ප දරුවන්ගේ අනාගතය විනාශ කරන අයුරු සෝමලතා සුබසිංහගේ **විකෘති** නාට්‍යයට පාදක වී ඇත" මේ පිළිබඳ විමසීමක යෙදෙන්න.

03. "මහාවග්ග පාළියෙහි පවත්නා බෞද්ධ විග්‍රහයත්, මහාවංශ කථා පුවතත් සම්බන්ධ කොට නූතන සමාජ ගැටලුවක් සාර්ථක ව සාකච්ඡා කිරීම සඳහා එදිරිවීර සරච්චන්ද්‍ර **සිංහබාහු** නාට්‍ය නිර්මාණය කොට තිබේ". මේ අදහස විභාග කරන්න.

04. කුමාරතුංග මුනිදාස **පිය සමර** ඇසුරෙන් ඉදිරිපත් කරන දැක්ම නූතන පියපුතු සබඳතාව පිළිබඳ කවරාකාරයෙන් වැදගත් වන්නේදැයි සාකච්ඡා කරන්න.

**හෝ**

චතු වාර්ගික ශිෂ්‍ය චර්යා සාධනයෙහිලා **ශික්ෂා මාර්ගය** පොත් පෙළ ඉදිරිපත් කළ අධ්‍යාපනික දර්ශනය නූතන අධ්‍යාපන සංකල්ප සමඟ සසඳමින් සාකච්ඡා කරන්න.

05. **යසෝදරාවත** ජන කවියා තත්කාලීන සමාජයේ කාන්තාවට දුන් උපදේශ නූතන කාන්තාව කෙරෙහි කවරාකාරයෙන් බලපාන්නේ දැයි නිදසුන් ඇසුරෙන් විමසීමක යෙදෙන්න.